# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 36 දරන වෙළඳ නැව් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ඔක්තෝබර් මස 28 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 ඔක්තෝබර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි — තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1988 අංක 36 දරන වෙළෙඳ නැව් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ඔක්තෝබර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 6/88

## 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1988 අංක 36 දරන වෙළෙඳ නැව් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ :—

**1971 අංක 52 දරන පනතට අලුතින් III අ කොටස සහ 123 අ සිට 123 ඖ දක්වා වූ වගන්ති ඇතුළත් කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 123 වන වගන්තිය ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස සහ වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා, ප්‍රධාන ප්‍රඥප්තියේ III අ කොටස සහ 123අ, 123ආ, 123ඇ, 123ඈ, 123ඉ, 123ඊ, 123උ, 123ඌ, 123ඒ සහ 123ඔ වගන්ති ලෙස බලාත්මක විය යුතුය :—

### "III අ කොටස— සමාන්තර ලියාපදිංචි කිරීම

අර්ථ නිරූපනය.

123අ. මේ කොටසෙහි—

"නැව හිස්ව කුලියට ගැනීම" යන්නෙන්, නැවක් සම්බන්ධයෙන් වනවිට, එම යෙදුමේ සජාතීය යෙදුම් ද සමඟ නැව කුලියට ගැනීම අදහස් වන අතර එම කුලියට ගැනීම මගින් කුලියට ගත් තැනැත්තා යම් එකඟ වූ කාල සීමාවක් සඳහා නැවේ සම්පූර්ණ පාලනය කළමනාකරණය, නැව ක්‍රියා කරවීම සහ නැවෙහි සන්තකය තමන් වෙතට පවරා ගනු ලබයි. තවද නැවේ නෞකාධිපතිවරයා සහ එහි සේවක පිරිස පත් කිරීමට සහ සේවයෙන් නෙරපීමට ඇති අයිතියද එසේ ම තමන් නැවේ අයිති කරු ලෙස තුන්වන පක්ෂ කෙරෙහි සිය වගකීම ඇරීමේ අයිතියද ඔහුට ලැබෙන තමුත් නැව විකිණීමට හෝ උකස් කිරීමේ අයිතිය ඔහුට නොලැබේ ;

"විදේශ නැව් ලේඛනය" යන්නෙන්, යම් විදේශ රටක නාවික කටයුතු සඳහා භාවිතා කරනු ලබන එම රටේ නැව් හෝ යාත්‍රා පිළිබඳ නාම විස්තරයක් ම සටහන් කිරීමේ කාර්ය සඳහා එම රටේ තබා ඇති ලේඛනයක් අදහස් වේ ;

"සමාන්තර ලියාපදිංචි කිරීම" යන්නෙන්, විදේශ නැව් ලේඛනයක ලියාපදිංචිය දිගටම බලපැවැත්වෙන නැවක් යම් කාලසීමාවක් සඳහා ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කිරීම අදහස් වේ.

2—ජ 104444—7,860 (88/08)

මෙම කොටස සමාන්තර ලියාපදිංචි කිරීමට අදාළ විය යුතු බව.

123ආ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුවද, මේ කොටසේ විධිවිධාන විදේශ නැව් ලේඛනයක ලියාපදිංචි කරනු ලැබූ නැව්වල සමාන්තර ලියාපදිංචි කිරීමට සහ එම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ද එසේම ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කරනු ලැබූ නැව් වලට සහ එම නැව් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

නැව්වල සමාන්තර ලියාපදිංචිය.

123ඇ. (1) ශ්‍රී ලංකාවේ නැවක අයිතිය දැරීමට 30 වන වගන්තිය යටතේ සුදුසුකම් ලැබූවේ යම් ස්වභාවික තැනැත්තකු විසින් නැතහොත් යම් සංස්ථාවක් විසින් ද එම ස්වභාවික තැනැත්තා හෝ සංස්ථාව විසින්, විදේශ නැව් ලේඛනයක ලියාපදිංචි කරනු ලැබූ නැවක් හිස්ව කුලියට ගනු ලැබුවේ නම් මේ කොටසෙහි සඳහන් අවශ්‍යතා වලට යටත්ව එම නැවෙහි සමාන්තර ලියාපදිංචි කිරීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කරනු ලැබූ යම් නැවක්, එම නැවෙහි සමාන්තර ලියාපදිංචි කිරීම ලියාපදිංචි කිරීමේ පොතෙහි දිගටම බලපවත්නා තාක් කල්, මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යතා.

123ඈ. (1) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි කිසිම විදේශ නැවක් ලියාපදිංචි කිරීම—

(අ) නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකද එම රටේ නීතිය මගින් සමාන්තර ලියාපදිංචි කිරීමට අවසර දෙනු ලබන්නේ නම් මිස ;

(ආ) නැව මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් හැර සහ ඒ නැව සම්බන්ධයෙන් උකස් කිරීම් හෝ වෙනත් බැඳීම් ඇති කිරීම, ඒ උකස් කිරීම් හෝ බැඳීම් ලියාපදිංචිකිරීම හෝ නිදහස්කිරීම හැර එම නැවේ ලියාපදිංචිය එම රටේ ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් තාවකාලිකව අත්හිටුවනු ලැබුවහොත් මිස ;

(ඇ) සමාන්තර ලියාපදිංචි කිරීම සඳහා නැවේ අයිතිකරු සහ ලියාපදිංචි උකස්ලාභියා කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් මිස

කරනු නොලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කරනු ලැබූ නැවක් හිස්ව කුලියට ගත් සෑම තැනැත්තකු විසින්ම, එම නැව මාරු කිරීම, හෝ පැවරීම සහ ඒ නැව සම්බන්ධයෙන් උකස්කිරීම් හෝ වෙනත් බැඳීම් ඇතිකිරීම, ඒ උකස්කිරීම් හෝ බැඳීම් ලියාපදිංචි කිරීම හෝ නිදහස් කිරීම සම්බන්ධයෙන් යම් විදේශ නැව් ලේඛනයක සටහන් කරන ලද යම් සටහනක් පිළිබඳව නැව් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය හැකි අතර තොරතුරුවල කාර්ය සඳහා නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් එම සටහන් ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

**සමාන්තර ලියාපදිංචි** කිරීම සඳහා කාර්ය පරිපාටිය.

123ඉ. (1) ශ්‍රී ලංකාවේ අයිතිය දැරීමට සුදුසුකම් ලත් තැනැත්තකු වූද, විදේශ නැවක් හිස්ව කුලියට ගත් යම් තැනැත්තකු විසින් නැව් සමාන්තර ලියාපදිංචි කිරීම සඳහා නැව් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර, එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා වූ අවශ්‍යතා සහ කොන්දේසි සපුරාලනු ලැබ ඇති බවට එම නැව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වේ නම්, එය කුලියට ගත් තැනැත්තා විසින් එම නැව කුලියට ගනු ලැබ ඇත්තේ යම් කාලසීමාවක් සඳහාද එම කාලසීමාව සඳහා නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි නැව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි නැවක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් සමග පහත දැක්වෙන ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය :—

(අ) එම නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකද එම රටේ නීතිය මගින්, නැව්වල සමාන්තර ලියාපදිංචිය සඳහා අවසර දී ඇති බව සහ එම නැව එම රටේ ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටවනු ලැබ ඇති බවට එම රටේ අදාළ නාවික බලධරයන් විසින් නිකුත් කරනු ලැබූ ස්ථිර කිරීමේ ලිපියක් ;

(ආ) එම නැවේ අයිතිය පිළිබඳව සහ එම නැව උකස් කිරීම හෝ නැව සම්බන්ධයෙන් වන වෙනත් බැඳීම් පිළිබඳව එම බලධරයන් විසින් නිකුත් කරන ලද ස්ථිර කිරීමේ ලිපියක් ;

(ඈ) සමාන්තර ලියාපදිංචිය සඳහා එම නැවේ ලියාපදිංචි උකස්ලාභීන් විසින් නිකුත් කරන ලද ලිඛිත කැමැත්ත ;

(ඈ) සමාන්තර ලියාපදිංචිය සඳහා නැවේ අයිතිකරු විසින් නිකුත් කරන ලද ලිඛිත කැමැත්ත ;

(ඉ) ඉල්ලුම්කරුට නැව හිස්ව කුලියට දෙනු ලැබුවේ යම් නැව් කුලී ගිවිසුමක් යටතේ ද එම නැව් කුලී ගිවිසුමේ පිටපතක්.

(3) සෑම ඉල්ලුම්පතක් සමගම නියමිත ගාස්තුවද ඉදිරිපත් කළ යුතු ය. සමාන්තර ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ යම් කාල සීමාවක් සඳහා ද එම සම්පූර්ණ කාල සීමාව සම්බන්ධයෙන්ම ගාස්තු කලින් ගෙවිය යුතු ය. එම ගාස්තු ගෙවනු ලැබ ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද එම කාල සීමාව අවසන් වීමේ දිනට පෙර වූ දිනයක දී සමාන්තර ලියා පදිංචි කිරීම අවලංගු කරනු ලැබුවහොත් කලින් ගෙවනු ලැබූ ගාස්තුවලින් කිසිම කොටසක් ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(4) සමාන්තර ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා නැවේ ටොන් බර අලුතින් මැනීම අවශ්‍ය නොවේ. 38 වන වගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි මිනුම් සහතිකය සහ ටොන්බර සහතිකය, විදේශ නැව් ලේඛනයෙහි අනුරූප ලේඛනවල පද නම මත නිකුත් කරනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාවේදී ගෙවනු ලැබිය යුතු මිනුම් ගාස්තු, ඒවා නිකුත් කිරීම සඳහා ගෙවනු ලැබිය යුතු ය. නැවේ ටොන් බරට හෝ විස්තර කිරීම්වලට බලපාන, නැව සම්බන්ධයෙන් පසුව කරනු ලබන වෙනස් කිරීම්, ලියාපදිංචි කිරීමේ පොතෙහි ලියා පදිංචි කරන ලද නැව්වලට අදාළව මේ පනතේ ඇති විධිවිධානවලට අනුව සිදු කළ යුතු අතර එම වෙනස් කිරීම් පිළිබඳව නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් නැව ලියාපදිංචි කරනු ලැබ ඇති රටේ අදාළ නාවික බලධාරීන් වෙත දැනුම් දිය යුතු ය.

(5) නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකදී ද එම රටේ අදාළ නාවික බලධාරීන්ගේ සහ නැවෙහි අයිතිකරු ද එමෙන්ම උකස්ලාභීන්ගේ ද කැමැත්ත ඇතිව, නැව හිස්ව කුලියට ගත් තැනැත්තා විසින් ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියා පදිංචි කරනු ලැබූ නැවක නම වෙනස් කිරීම සඳහා නැව් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර එවැනි වෙනස් කිරීමක් සිදු කළ යුත්තේ ලියා පදිංචි කිරීමේ පොතෙහි ලියා

පදිංචි කරනු ලැබූ නැව්වලට අදාළව ඇති මේ පනතේ විධිවිධානවලට අනුකූලවිය. නැව් ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකද එම රටේ අදාළ නාවික බලධාරීන් වෙත වෙනස් කිරීම පිළිබඳව නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දිය යුතු ය.

(6) සමාන්තර ලියා පදිංචි කිරීම සම්පූර්ණ කිරීමේදී 47 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයට සමාන ආකෘති පත්‍රයක සහ ශ්‍රී ලංකාවේ නැවක් ලියා පදිංචි කිරීමේදී ලියා පදිංචි කළ යුතු විස්තරය ද එසේම නැවේ අයිතිකරු, නැව හිස්ව කුලියට ගත් තැනැත්තා සහ විදේශ නැව් ලේඛනය පිළිබඳ විස්තර ද ඇතුලත් කරමින් ද සමාන්තර ලියා පදිංචි කිරීම පිළිබඳ සහතිකයක් නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලබා දිය යුතු ය. නැව් ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකද එම රටේ අදාළ නාවික බලධාරීන් වෙත සමාන්තර ලියා පදිංචිය පිළිබඳ සහතිකයේ පිටපතක් යැවීම සඳහා නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(7) සමාන්තර ලියාපදිංචිය පිළිබඳ සහතිකයේ වලංගු භාවය අවසන් වන දිනය නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් එම සහතිකයේ සඳහන් කළ යුතු ය.

(8) මේ පනතේ විධිවිධානවලට සහ නියම කරනු ලැබිය හැකි පරිදි වූ කොන්දේසිවලට යටත් වූ රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාන්තර ලියාපදිංචිය පිළිබඳ සහතිකයේ වලංගුතාවයේ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

**නැවෙහි ශ්‍රී ලංකාවේ ධජය නංවා තැබිය යුතු බව.**

123ඊ. ලියා පදිංචි කිරීමේ පොතෙහි සමාන්තර මේ කොටස යටතේ සමාන්තර ලියා පදිංචිය බලාත්මක වන්නේ යම් කාලයක් සඳහා ද එම කාලය ඇතුළත දී එම නැවෙහි වෙනත් යම් රටක ධජය නොව ශ්‍රී ලංකාවේ ධජය නංවා තැබිය යුතු ය.

(2) මේ කොටස යටතේ යම් නැවක් සම්බන්ධයෙන් සමාන්තර ලියා පදිංචිය අවසන් වීමෙන් පසුව හෝ අවලංගු කරනු ලැබීමෙන් පසුව එම නැවෙහි ශ්‍රී ලංකා ධජය නංවා නොතිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් නැවක් සේවයේ යොදවනු ලබන අවස්ථාවකදී, නැව කුලියට ගත් තැනැත්තා, නෞකාධිපති හෝ නැව භාරව සිටින තැනැත්තා තනි තනිව එක් තැනැත්තකුට රුපියල් පනස් දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

**සමාන්තර ලියා පදිංචි කිරීමේ දී උකස් කිරීම.**

123ද. III වන කොටසේ 4 වන පරිච්ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද සමාන්තර ලියාපදිංචි කිරීමේ අවස්ථාවේ දී ලියා පදිංචි කිරීමේ කොටසේ ලියාපදිංචි කරනු ලැබූ නැවකට වැය බරක් වන යම් උකසක් හෝ බැඳීමක් දිගටම බලපැවැත්විය යුතු අතර ඒවා නැව සම්බන්ධයෙන් වන වැය බර විය යුතු ය. තවද එම වැය බර ඇතිකර ගත් අවස්ථාවේ දී ඒවා පාලනය වූ නීතිය මගින්ම ඒවා පාලනය විය යුතු අතර ලියා පදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියා පදිංචි කිරීමේ කොටසෙහි නැව ලියාපදිංචි කරනු ලැබ තිබීමේ හේතුවෙන් එම වැය බරට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි නැව සමාන්තර ලියාපදිංචි කිරීමෙන් පසුව, නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් රටකද එම රටේ නීතියට අනුකූලව නැව සම්බන්ධයෙන් උකසක් හෝ වෙනත් බැඳීමක් නැවේ අයිතිකරු විසින් පමණක් ඇති කළ යුතු අතර එම උකස හෝ බැඳීම එම රටේ අදාළ නාවික බලධරයන් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියා පදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කරනු ලැබූ නැවක් සම්බන්ධයෙන්, මේ පනතෙහි III වන කොටසෙහි 4 වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කිරීමේ පොතෙහි උකසක් ලියා පදිංචි කිරීමට ඉඩ නොදිය යුතු ය.

(4) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් උකස් කිරීම් හා වෙනත් බැඳීම් තොරතුරු සැපයීමේ කාර්ය සඳහා ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි වාර්තා ගත කරනු ලැබිය යුතු ය.

**ලියාපදිංචිය අවලංගු කිරීම.**

123ඨ. ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියා පදිංචි කිරීමේ කොටසෙහි ලියා පදිංචි කරනු ලැබූ නැවක සමාන්තර ලියාපදිංචිය—

(අ) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියා පදිංචි කිරීමේ කොටසෙහි නැව ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ යම් කාලසීමාවක් සඳහා ද එම කාලසීමාව අවසාන වීමේ දී;

(ආ) ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කරනු ලැබ සිටින නැනැත්තා ශ්‍රී ලංකාවේ නැවක අයිතිය දැරීමට සුදුසුකම් ලැබීම අවසන් වීමේ දී;

(ඇ) නැව සම්බන්ධයෙන් නැව හිස්ව කුලියට ගැනීමේ ගිවිසුම අවසන් වීමේ දී;

(ඈ) නැව හිස්ව කුලියට ගත් තැනැත්තා, මේ කොටසේ යම් විධිවිධානයකට හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයකට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වුව හොත්

එම සමාන්තර ලියාපදිංචිය අවලංගු කිරීමට නැව් රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නැවක සමාන්තර ලියාපදිංචිය අවලංගු කිරීමේ දී නැවේ නෞකාධිපතිවරයා විසින් නැව සම්බන්ධයෙන් වූ සමාන්තර ලියාපදිංචිය පිළිබඳ සහතිකය නැව් රෙජිස්ට්‍රාර්වරයාට භාර දිය යුතු ය.

(3) සාධාරණ හේතුවක් නොමැතිව (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන, නැව කුලියට ගත් යම් තැනැත්තකු හෝ නැවේ නෞකාධිපතිවරයකු වරදකට වරදකරු වන අතර ඒ සඳහා වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

116 වන හෝ 118 වන **වගන්ති අදාළ නොවිය යුතු බව.**

123ඒ. ලියාපදිංචි කිරීමේ පොතෙහි සමාන්තර ලියාපදිංචි කිරීමේ කොටසෙහි ලියාපදිංචි කරනු ලැබූ නැවකට 116 වන හෝ 118 වන වගන්තිවල සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

නියෝග.

123ඔ. පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ කොටස මගින් නියම කරනු ලැබ ඇති යම් ලේඛනයක ආකෘති පත්‍රය හා එහි අඩංගු විය යුතු විස්තර ;

(ආ) සමාන්තර ලියාපදිංචිය සඳහා වූ කාර්ය පටිපාටිය ;

(ඇ) සමාන්තර ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත සෑදිය යුතු ආකාරය සහ පිළිවෙල ;

(ඇ) ඉල්ලුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන සහතික කළ යුතු තැනැත්තන් ;

(ඉ) මේ කොටස යටතේ අය කරනු ලැබිය හැකි ගාස්තු, අය කරගත යුතු මුදල් සහ අය කිරීම් සහ එම ගාස්තු, අයකරගත යුතු මුදල් සහ අය කිරීම් ලබාගත යුතු ආකාරය ;

(ඊ) මේ පනතේ මේ කොටස යටතේ නියම කරනු ලැබීමට අවශ්‍ය වෙනත් යම් කරුණක්.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.